22 සයුරු ගැබෙන් මතු වූ නැව

අතීත රෝහණ රාජධානියේ වළවේ ගංගා මිටියාවතේ පිහිටි රිදියගම නගරය සහ රම්බා විහාරය ආදි ප්‍රදේශවල සිට ඔරු පාරු ඔස්සේ ගෙන එන දේශීය නිෂ්පාදන රට පැටවූයේ ගොඩවාය වරායෙනි. ඒ ක්‍රිස්තු පූර්ව යුගයේ සිට ක්‍රි.ව. ආරම්භක කාලයේ දී ය. ක්‍රි.ව. දෙවන සියවසේ දී, වරායෙන් ලැබෙන බදු මුදල් ඒ ආසන්නයේ පිහිටි ගොඩවාය විහාරස්ථානයේ දියුණුව සඳහා යෙදවිය යුතු බවට ගජබාහු රජු විසින් පිහිටුවා ඇති සෙල්ලිපිය මෙයට සාක්ෂි සපයයි.

ඒ කාලයේ මේ වරාය ආසන්නයේ ගිලී ගිය නැවක තතු සමුද්‍ර ගවේෂණයක් මගින් සොයා ගත් ආකාරය මේ පාඩමට විෂය වෙයි.

ගාල්ල සමුද්‍ර පුරාවිද්‍යා ඒකකයේ ස්ථාන භාර නිලධාරි ඩබ්. එම්. චන්ද්‍රරත්න, ඒ. එම්. ඒ. දයානන්ද, රසික මුතුකුමාරණ, එස්. එම්. නන්දදාස, කේ. ඩී. පාලිත වීරසිංහ, ඩබ්. කේ. සනත් හා දුලිප් අසංක යන මහත්වරුන් ගවේෂණ කටයුතු සඳහා සහභාගි වී ඇත.

නොමිලේ බෙදා හැරීම සඳහා ය.

ඇත දියඹේ හක්බෙල්ලන් සොයා කිමිදුණු තරුණයෝ දෙදෙනෙක් කඹයක ගැට ගසා ගත් යමක් රැගෙන ඉතා අපහසුවෙන් ගොඩබිමට පැමිණියහ. මොවුන් දෙදෙනාට මුහුදු පතුලේ තිබූ අපූරු වස්තුවක් හමු වී තිබිණි.

කුඩා ප්‍රමාණයේ ගල් ආසනයක් වූ එය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ස්ථාන භාර නිලධාරියා අතට පත් විය. නිලධාරියා ඔවුන්ගෙන් ඒ පිළිබඳ තතු විමසී ය.

“කොයි හරියෙ ද තිබුණෙ?”

“ගොඩක් ඈත, අඩි සියයට වඩා ගැඹුරේ.”

“වළං කටු කෑලි ගොඩක් තියෙනවා වගේ පේනවා. ලී කැබලි වගේත් පේනවා.”

ගොඩවායේ මුහුදු පත්ලෙන් හමු වූ ගල් ආසනය

ගල් ආසනයේ බැඳී තිබුණු සිප්පි හා කොරල් පරිස්සමින් ඉවත් කළ නිලධාරියා එය පිරිසිදු කළේ ය.

මෙවැනි ගල් ආසනයක් මුහුදේ තිබී හමු වූ ප්‍රථම අවස්ථාව මෙය යි. එහි නන්දිපාද සලකුණක් ද ඒ සමග ත්‍රිශූලයක සලකුණක් ද සටහන් කොට තිබිණ. මේ සලකුණ භාවිතයට ගෙන ඇත්තේ ක්‍රිස්තු පූර්ව තුන්වැනි සියවසේ සිට ක්‍රිස්තු වර්ෂ හතර වැනි සියවස දක්වා කාලයේ දී ය. පුරාවිද්‍යාඥයන් පවසන්නේ මෙවැනි ගල් ආසන අතීතයේ බෞද්ධ භික්ෂූන් වහන්සේ අසුන් ගැනීම සඳහා පාවිච්චි කර ඇති බව යි.

පුරාවිද්‍යාඥයෝ ගල් ආසනය හමු වූ තැන සොයා ගවේෂණය කළහ.

එම ගවේෂණයට සම්බන්ධ වූ රසික මුතුකුමාරණ මහතා මේ අපූරු පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති ස්ථානය ගැන මෙසේ විස්තර කළේ ය.

“එතැන ගිලී ගොස් තිබෙන්නේ පැරණි දැවමය නෞකාවක් බව පෙනී ගියා. එහි මැටි බඳුන් සහ වෙනත් අවශේෂ හමු වෙනවා. දැව කොටස් නම් ඉතා දැඩි සේ දිරා ගිහින්. මුහුදු පත්ලේ කොරල් හා සිප්පි බැඳීම නිසා එක්තරා මට්ටමකින් ඒවා ආරක්ෂා වෙනවා.”

එතැන තිබුණු ගල් ආසනය අයත් යැයි අනුමාන කරන යුගයට ම අයත් කළු රතු මැටි බඳුන් ද සොයා ගැනීමට පුරාවිද්‍යාඥයෝ සමත් වූහ. මේ සොයා ගැනීමත් සමග ගොඩවායෙන් සොයා ගෙන ඇත්තේ පුරාණ සිංහල රාජධානි සමයට අයත් වූ නෞකාවක් යැ යි යන මතය ස්ථිර විය.

වෙරළේ සිට කිලෝමීටර් තුනක් පමණ ඈත මුහුදේ අඩි 110ක් පමණ ගැඹුරින් මේ ස්ථානය පිහිටා තිබිණි. ගැඹුර වැඩි වීම හේතුවෙන් එහි ගවේෂණ කටයුතු කිරීම වෙහෙසකර කාර්යයක් විය. 2010 දෙසැම්බර් මාසයේ ආරම්භයත් සමග ගවේෂණ කටයුතු යළි ආරම්භ කෙරිණි. එමගින් වඩාත් පැහැදිලි නිගමනයන්ට එළඹීමට ඔවුන්ට හැකියාව ලැබිණි.

“අපට ලැබුණු මේ බඳුන් ඉතා වැදගත් වෙනවා. ඒවා හැඩය අනුව ඉන්දියාවේ සෑදූ කළු රතු මැටි බඳුන් අනුකරණය කරන ලද නිෂ්පාදනයක් බව පැහැදිලි යි. කාබන් 14 කාල නිර්ණය ක්‍රමයට අනුව මේවා ක්‍රිස්තු පූර්ව දෙවැනි සියවස හා ක්‍රිස්තු වර්ෂ තුන්වැනි සියවස අතර කාලයට අයිති යි. මැටි බඳුන් සමග ම අතීතයේ ඒවා ඔප දැමීමට භාවිත කළ ‘ග්ලේස්’ නම් ද්‍රව්‍ය කුට්ටි කීපයක් ද හමු වුණා. මේ දේවල් සහ කලින් හමු වුණු ගල් ආසනය සැලකිල්ලට ගෙන අපට කියන්න පුළුවන් මේ නෞකාව ක්‍රිස්තු වර්ෂ මුල් සියවස් දෙක තුන තුළ ගිලී ගිය එකක් බව.”

පුරාවස්තුන්ගේ තත්ත්වය හා ඒවායේ විසිර යෑම මෙන් ම පැරණි යාත්‍රාවේ යැයි සැලකෙන කොටස් සහිත ප්‍රදේශය විධිමත්ව පරීක්ෂා කිරීමෙන් අදාළ ගණනය කිරීම හා විශාලත්වය අනුමාන කිරීම සිදු කෙරිණි.

මෙහි වැඩිපුර ම දක්නට ලැබුණේ මැටි බඳුන් සමූහයක අවශේෂ තොගයකි. ඒ කැබලි පරීක්ෂා කිරීමේ දී විශාල බරණි, ආහාර පිසින ඇතිළි සහ මුව කුඩා මුට්ටි විශේෂයන්ගේ කොටස් හඳුනා ගැනිණි. ඇතැම් බරණි මීටර 1.3ක් පමණ උසැති, මීටර් 0.8ක් තරම් විශාල වන බව ද නිගමනය කෙරිණි.

මතුපිට තිබුණු මැටි බඳුන් කැබලිවලින් විශාල ප්‍රමාණයක් තුනී වැලි තට්ටුවකින් වැසී ගොස් තිබේ. බොහෝ ස්ථාන අතින් කලතා වැලි ඉවත් කළ පසු මැටි බඳුන් ඉතා පහසුවෙන් දැක ගත හැකි විය. නැවේ මධ්‍යය ලෙස සැලකෙන කොටසේ ඉතා දුර්වල හා පැරණි දැවමය කොටස් සහිත ගොඩැල්ල ඉතා වැදගත් ස්ථානයකි. මේ ස්ථානය ගවේෂණයෙන් තවත් ගල් ආසන දෙකක් පුරාවිද්‍යාඥයන්ට හමු විය. තවත් වැදගත් සොයා ගැනීමක් වූයේ දිරාපත් වූ දැව කොටස්වල අවශේෂ හා දිරා යමින් තිබූ ලෝහමය කොටස් සමූහයකි. ඒ අතර තඹ කොටස් කිහිපයක් ද තිබිණි.

මේ ගවේෂණයේ දී තවත් ගල් ආසන තුනක් එකිනෙක ආසන්නයේ තිබෙන ආකාරය ද පුරාවිද්‍යාඥයන්ගේ නිරීක්ෂණයට බඳුන් විය. ඔවුන්ගේ මතය වූයේ මේ නෞකාව අනුරාධපුර රාජධානි සමයේ මුල් යුගයේ දී ගිලී ගිය රුවල් නැවක් විය යුතු බව යි.

විදේශ රටවල් සතුව මුහුදේ පුරාවිද්‍යාත්මක වස්තු ගවේෂණය කිරීමේ හා ඒවායේ කාලය තහවුරු කිරීමේ නවීන තාක්ෂණික ක්‍රමෝපායයන් පවතින බැවින් මේ පිළිබඳ වැඩිපුර පරීක්ෂණ සඳහා විදෙස් සහාය ලබා ගැනීම ගාල්ල සමුද්‍ර පුරාවිද්‍යා ඒකකයේ තීරණය විය. ඒ අනුව නැවෙන් හමු වූ දැව කොටස් ඉන්දියාවේ දී සියුම් පරීක්ෂණයකට භාජනය කරන ලදි. එහි දී කළ කාල නිර්ණය අනුව මේ දැවමය නෞකාව ක්‍රිස්තු පූර්ව දෙවැනි හෝ පළමු වැනි සියවසට අයත් එකක් යැයි තහවුරු විය.



ගවේෂණයට ලක් වූ යාත්‍රාවේ තිබූ දැව අවශේෂ

ගල් ආසනයක් ඔස්සේ ලැබුණු තොරතුරු පසුපස ගිය පුරාවිද්‍යාඥයන් සොයා ගෙන ඇත්තේ ලොව ඉපැරණිතම නෞකාවකි. මෙහි ඉදිරි ගවේෂණ හා සංරක්ෂණ කටයුතු යළි ආරම්භ කෙරෙනු ඇත. එවිට අතීත ශ්‍රී ලංකාවේ මුහුදු ගමන් හා නැව් සෑදීමේ තාක්ෂණය පිළිබඳ අපූරු වැදගත් තොරතුරු රැසක් අනාවරණය කර ගත හැකි වේ ය යන්න පුරාවිද්‍යාඥයන්ගේ අපේක්ෂාවයි.



අරුත් පැහැදිලි කිරීම

නන්දිපාද සලකුණ	- ශුභ සලකුණකි. ධාර්මිකභාවය නියෝජනය කරන සංකේතයක් සේ සැලකේ.
ත්‍රිශූලය	- උල් තුනක් ඇති ආයුධය
කාබන් 14 කාල නිර්ණය	- කාබන් නමැති මූල ද්‍රව්‍යයේ විකිරණශීලී සමස්ථානිකයකි. කාබනික ද්‍රව්‍යයක් සහිත පුරා වස්තුවක කාලය මැනීමට කාබන් මූල ද්‍රව්‍යයේ වෙනස් වීම පදනම් කර ගනු ලැබේ.
අවශේෂ	- ඉතිරිය, ශේෂය
බරණි	- මැටි, ලෝහ, විදුරුවලින් සෑදූ ලොකු භාජනයක්

අවබෝධය

1. මුහුදු පත්ලේ තිබී මුලින් ම හමු වූ අපූර්ව වස්තුව කුමක් ද?
2. මෙවැනි ගල් ආසන ප්‍රයෝජනයට ගෙන ඇත්තේ කවර කාර්යයක් සඳහා ද?
3. මෙහි දී හමු වූ මැටි බඳුන් වර්ග මොනවා ද?
4. ගල් බංකු හා මැටි බඳුන් අයිති යැයි නිර්ණය කළ කාල වකවානු සඳහන් කරන්න.
5. කාල නිර්ණය අනුව ගොඩවායේ මුහුදෙහි ගිලී ගිය නැව කුමන කාලයකට අයත් ද?

නොමිලේ බෙදා හැරීම සඳහා ය.

තනි පද

පහත දැක්වෙන පද දෙස බලන්න.

ජලයේ ගැඹුරු ස්ථානය - දියඹ
පැරණි වස්තු ගැන හදාරන විද්‍යාව - පුරාවිද්‍යාව

වචන කිහිපයකින් කියවෙන අදහසක් සඳහා යෙදෙන පද 'තනි පද' යනුවෙන් හැඳින්වේ. ඒ අනුව 'දියඹ' හා 'පුරාවිද්‍යාව' යනු තනි පද යි.

ලිඛිත අභ්‍යාස

1. **පහත දී ඇති එක් එක් අදහස දීම සඳහා යෙදිය හැකි තනි පද වරහන් තුළින් තෝරා, ඉදිරියේ ඇති හිස්තැනෙහි ලියන්න.**

i. යකඩයෙන් කරන ලද - ....
ii. බොහෝ කලක සිට පැවතෙන - ....
iii. හේතු අනුව යමක් සිතා ගැනීම - ....
iv. මනා සේ රැක ගැනීම - ....
v. දිය ගොඩ දෙකෙහි වසන - ....
vi. අලුතින් යමක් සෙවීම - ....
vii. සුපරීක්ෂාකාරීව බැලීම - ....
viii. ලීයෙන් තැනූ - ....

(අනුමානය, නිරීක්ෂණය, දැවමය, චිරාගත, ලෝහමය, ගවේෂණය, උභයජීවි, සංරක්ෂණය)

රචනා ලිවීම

රචනා ලිවීමේ හැකියාව උසස් ලේඛන කුසලතාවකි. දී ඇති මාතෘකාව යටතේ කරුණු ක්‍රමානුකූලව පෙළගස්වා ඉදිරිපත් කිරීම රචනාවකින් අපේක්ෂා කෙරේ. රචනා ලිවීමේ දී නිවැරදි වාක්‍ය රීති අනුගමනය කිරීමත්, අක්ෂර වින්‍යාසය, පද බෙදීම හා විරාම ලක්ෂණ නිවැරදිව භාවිත කිරීමත් අවශ්‍ය වේ. පැහැදිලි අත් අකුරු ද රචනාව කෙරෙහි ආකර්ෂණය යොමු වීම සඳහා හේතු වෙයි.

රචනාව ලිවීමට පෙර මාතෘකාව හොඳින් කියවා ඒ සඳහා සැකිල්ලක් නිර්මාණය කර ගැනීම ඉතා ප්‍රයෝජනවත් වෙයි. එමගින් මාතෘකාවට අදාළ කරුණු වඩාත් සංවිධානාත්මකව ඉදිරිපත් කළ හැකි ය. රචනා සැකිල්ලක් ප්‍රවේශය (ආරම්භය), ඇතුළත් විය යුතු කරුණු (අන්තර්ගතය), අවසානය (නිගමනය) යන කොටස් තුනෙන් යුක්ත විය හැකි ය.

'කෘෂිකර්මාන්තය නංවමු' යන මාතෘකාව යටතේ රචනා සැකිල්ලක් සකසා ගන්නේ මෙසේ ය.

1. ප්‍රවේශය
2. කෘෂිකර්මාන්තයේ අගය
3. අපේ රජවරුන් කෘෂිකර්මාන්තයට කළ මෙහෙය
4. රටට ආහාර සැපයීමට ගොවීන් ගන්නා තැත
5. කෘෂිකර්මාන්තය කෙරෙහි ඇති ගැටලු
6. කෘෂිකර්මාන්තය නැංවීමට යෝජනා
7. අවසානය

ලිඛිත අභ්‍යාස

1. **පහත දී ඇති රචනා මාතෘකා සඳහා රචනා සැකිලි නිර්මාණය කරන්න.**
   i. පරිසරය රැක ගනිමු
   ii. මරු කැඳවන රිය අනතුරු
   iii. මුහුදු පතුලේ කිමිදුණෙමි
   iv. වන පෙතක අසිරිය
   v. නැවකින් සවාරියක්

2. **එක් මාතෘකාවක් යටතේ සැකසූ සැකිල්ලකට අනුව රචනයක් ලියන්න.**

නොමිලේ බෙදා හැරීම සඳහා ය.